**මධ්‍යම පරිසර අධිකාරිය - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මධ්‍යම පරිසර අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මාර්ගස්ථ තොග ශේෂය තුල ස්ථාවර වත්කම් මිලදීගැනීමට ලබාදී ඇති රු.8,054,407 ක් සහ ගෙවීමක් සිදු නොකරන ලද අයිතම 17 කට අදාල රු.8,856,689 ක්, මාර්ගස්ථ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2021 ජනවාරි 01 දිනට මාර්ගස්ථ තොග ශේෂය තුල ඇතුලත්ව තිබුණු රු.1,430,000 වටිනා වායු සමීකරණ යන්ත්‍ර 03 ක වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට වූ මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂයෙන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු මාර්ගස්ථ තොග ශේෂයේ වටිනාකම රු.18,341,096 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2022 වර්ෂයේදී නිසි පරිදි ගැලපුම් කිරීමට කටයුතු කරමි. | මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් අධිකාරියට පවරා දී තිබුණු ඉඩමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවීමට නියම කරන ලද පොලී මුදල වූ රු.17,770,995 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. මෙම නිසා වර්ෂයේ ඌණතාවය ඉහත අගයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2022 වර්ෂයේ දි මෙම ගෙවීම් සම්බන්ධයෙන් ගිණුම් හි හෙළිදරව් කිරිමට කටයුතු කරමි. | අවශ්‍ය ගැලපුම් සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) 2004 වර්ෂයේ සිට කොම්පෝස්ට් බඳුන් විකිණීමෙන් ලද මුදලින් ආදායම් ගිණුමට බැර විය යුතු ප්‍රමාණය හඳුනා ගැනීමකින් තොරව රු.7,887,531 ක ශේෂයක් ජංගම නොවන වගකීම් යටතේ කොම්පෝස්ට් බඳුන් සංචිත ලෙස ගිණුම් ගත කර තිබුණි. | ආදායම් ගිණුමට බැර විය යුතු වුවත් අතපසුවීමෙන් සංචිත ලෙස හඳුනා ගෙන ඇත. පෙර වර්ෂවල ගිණුම් පරීක්ෂා කර බලා මෙම ගිණුම් ගැලපීමේ කටයුතු කරමි. | අවසන් ගිණුම්වල අවශ්‍ය ගැලපුම් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 | සමාලෝචිත වර්ෂයේ රු.15,434,000 කට මිලදී ගනු ලැබූ ට්‍රැක්ටර් හතර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | මෙම ට්‍රැක්ටර් රථ සුරකිමු ගංගා පාරිසරික වැඩසටහන යටතේ මිළදී ගෙන තිබෙනුයේ එම වැඩසටහන හා අනුගත අරමුණු හා බැඳෙන තෙවන පාර්ශවයකට ලබා දීම සඳහාය. එබැවින් අධිකාරියේ ස්ථාවර වත්කම් ලෙස දැක්විය නොහැක. | ට්‍රැක්ටර් රථ භාර දීම හා පැවරීම් කටයුතු විධිමත් ලෙස සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 24(ඈ) -2(1) වගන්තිය | පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වගකිව යුතු බව දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශයට පත් කර තිබූ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ 5 කට අදාලව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. | මෙම ප්‍රදේශ 5 ට කළමනාකරණ කමිටු පිහිටුවීමට නිර්දේශ වී නොමැත. අවශ්‍ය අවස්ථා වලදී පරිසර ආරක්ෂණයට අදාළ වන සියළුම පාර්ශවයන් සමඟ රැස්වීම් පවත්වා සුදුසු තීරණ ගනු ලැබේ. | පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ)2009 පෙබරවාරි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 111 පරිච්ඡේදය | සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත්කර තිබූ වැඩසටහන් කළමනාකරුවෙකු වෙත 2021 අප්‍රේල් මස සිට දෙසැම්බර් දක්වා මාසික වැටුප හා ඉන්ධන දීමනාව වශයෙන් මසකට රු.170,000 බැගින් ගෙවීම් කර තිබුණු අතර මේ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මෙම දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2021 සැප්තැම්බර් 27 දින යොමු කර ඇත. එම සංදේශයේ සංශෝධන කිහිපයක් අමාත්‍යාංශයෙන් දැනුම් දුන් අතර සංශෝධිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2021 දෙසැම්බර් 20 අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ගෙවීම් සිදුකිරීමට ප්‍රථම අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) කොම්ප්ට්‍රෝල් ජනරාල්ගේ 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 2(අ) ඡේදය | අධිකාරියට අයත් වාහන 03 ක් අපහරණය සඳහා යෝජනා කර තිබුණද 2022 මැයි 15 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය සඳහා වූ වාහන තුනෙන් , දෙකක් බඳෙහි (Chassis) සිදුව ඇති හානිය හේතුවෙන් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණයට මෝටර් රථ දෙපාර්තුමේන්තුවෙන් අවසර ඉල්ලා ඇත.<br>එම අවසර ලැබීමෙන් අනතුරුව වාහන තුන අපරහරණ කරමි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |
| (ඉ) කොම්ප්ට්‍රෝල් ජනරාල්ගේ 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ | අධිකාරියට අයත් වාහන 04 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ රියදුරු පුරප්පාඩු 7 ක් පවතී. පුරප්පාඩු සඳහා රියදුරන් බඳවා ගැනීමෙන් පසු රියදුරන් එම වාහන සඳහා අනුයුක්ත කරනු ලබයි. දැනට අධිකාරියේ සියළුම රියදුරු කාර්යය | -එම- |

| | | |
|---|---|---|
| චක්‍රලේඛය 2(ආ) ඡේදය | | මණ්ඩලය වෙත එක් රථය බැගින් අනුයුක්ත කර ඇත. පිළිතුර අදාල නොවේ. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 25 කට අදාල බැංකු ගිණුම් 21 ක 2021 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු.201,109,015 ක ශේෂය අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුමට බැර විය යුතු වුවත් කාර්යාල 18 කින් එකතු කරන ලද ආදායම් බැර වී නොතිබුණි. | ගිණුම් 21 හි ශේෂයන් සෑම මසකම අවසාන දිනට ප්‍රධාන කාර්යාලීය ලංකා බැංකු ගිණුමට මාරු කරන ලෙස ඒ ඒ බැංකු වෙත ස්ථාවර නියෝග ලබා දී ඇත. ඒ අනුව විමසුමෙහි දක්වා ඇති ශේෂ මාරු නොවීම පිළිබඳ බැංකු සමඟ සාකාච්ඡා කර ඉදිරියේ දී එය නිවැරදි කිරිමට කටයුතු කරමි. | දිස්ත්‍රික් කාර්යලවල බැංකු ගිණුම් ශේෂයන් ගිණුම් වලින් හෙළදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,121,759 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 135,512,005 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.113,390,246 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදානවල වැඩිවීම සහ අධිකාරියේ ආදායමේ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුරකිමු ගංගා වැඩසටහනේ අරමුණු වලට පටහැනිව එම ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් රු2.,030,000 ක් වැය කර Electric cart රථයක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. | පූජා භූමිය තුල ගමන් කරන මෝටර් රථ වලින් නිකුත් කරන දුම මගින් සිදු කරන වායු දූෂණය හේතුවෙන් මතුපිට ජලය දූෂණය වීමේ හැකියාවක් ඇති බැවින් එකී තත්ත්වයන් අවම කිරිම සඳහා කතරගම නිලමෙතුමාගේ සහ දිසාපතිතුමාගේ ඉල්ලීම පරිදි රුහුණු මහා දේවාල භූමියේ වායු දූෂණය අවම කිරීමේ ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස පරිසර හිතකාමී | අරමුණට පටහැනිව තීරණය ගෙන මිලදී ගැනීම සඳහා කටයුතු කරන ලද නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විදුලි බලයෙන් ක්‍රියා කරන මෙම රථය (Electric cart) ලබා දෙන ලදී. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියට අවුරුදු 50 ක බදු පදනම මත 2000 වර්ෂයේ අතිරේකව ලබා ගත් පර්චස් 129.88 ඉඩම් කොටස වර්ෂ 19 කට වැඩි කාලයක් භුක්ති විඳීම සිදුකර තිබුණද අදාල බදු මුදල් ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීමක් සිදුකර නොතිබුණි. මෙම ඉඩම් කොටස නීත්‍යානුකූලව පවරා නොගැනීම නිසා ඉන් පර්චස් 20 ක ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් විදුලිබල මණ්ඩලයට ලබා දීමට කටයුතු කිරීම නිසා අධිකාරියට එම ඉඩම් ප්‍රමාණය අහිමි වී තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් අමතර රූඩ් 03 පර්චස් 9.88 ඉඩමට ගෙවීම් කරන ලෙස දන්වා ඇත. මේ සඳහා මහාභාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලුවද නොලැබුණි. ගෙවීම් සිදුකර ඉඩම පමණක් ගැනීමට කටයුතු කර ඇති අතර මේ වන විට රු.10,397,822 ක් ගෙවා ඇත. ඉතිරි මුදලද ගෙවීමට කටයුතු කරමින් පවතී. | ඉඩම් කොටස නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| (ආ) 2021 වර්ෂයේ පරිසර අමාත්‍යාංශයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර තිබූ අධිකාරියේ Eco Club Materials and EPP Materials හි ප්‍රගතියට අදාලව ඉදිරිපත් කර තිබූ අයිතම 15 ක සත්‍ය වශයෙන් ආයතන වෙත බෙදාහරින ලද ප්‍රමාණයන් අතර ඒකක 387,523 ක වෙනසක් පැවතුණි. | 2019 සිට කොවිඩ් වසංගත තත්වය හා අයහපත් ආර්ථික අර්බුධය හේතුවෙන් පාසැල් පද්ධතියම අකර්මනයවී ඇත. දූරස්ථ මාර්ගෝපදේශක ක්‍රමයට විවිධ පාරිසරික වැඩසටහන් පැවැත්වුවද පරීක්ෂණ පැවැත්වීමට නොහැකිවීමෙන් සහතිකපත්‍ර, සටහන් පොත්, පදක්කම් හා අනෙකුත් ද්‍රව්‍යයන් බෙදා දීමට නොහැකි විය. එම නිසා මෙම අයිතමයන් වල අතිරික්තයක් දැනට අධිකාරියේ ඇත. | අවශ්‍යතාවයට පමණක් මුද්‍රණ කටයුතු සිදු කිරීමත් ඒවා සැලැසුම්ගත පරිදි බෙදා හැරීමත් සඳහා නිලධාරියකුට වගකීම පැවරිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත විගණිත දිනය වන විටත් සංශෝධනය කර නොතිබුණි. | නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවෙන් ජාතික පාරිසරික පනත් කෙටුම්පතට කරන ලද නිරීක්ෂණයන් අධිකාරිය විසින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | අප්‍රමාදව පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිළිසරු ව්‍යාපෘතිය විසින් අධිකාරිය වෙත 2018 දෙසැම්බර් 06 දින ලබා දී තිබූ වාහන තුනක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පරිසර කළමනාකරණ කටයුතු සිදු කිරීමේදී තොරතුරු රැස්කිරීම අරමුණු කොටගෙන රු.මිලියන 1.39 කට 2020 දෙසැම්බර් 15 දින මිලදීගෙන තිබූ ඩ්‍රෝන යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | ඉදිරියේ දි කඩිනමින් වාහන පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට වග බලා ගන්නා බව දන්වමි.<br>පරිසර අධිකාරිය තුල ඩ්‍රෝන යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි මානව සම්පතක් නොමැත. ගුවන් හමුදාව මඟින් සිදු කල යෝජනාවට ප්‍රතිචාරයක් වශයෙන් මෙම ඩ්‍රෝන යන්ත්‍රය මිළදී ගැනිම සිදු කරන ලදී.<br>2020 දෙසැම්බර් 08 දින දෙපාර්ශවයේම නීති නිළධාරීන් ද ඇතුලත්ව කණ්ඩායම් 2ක් මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කරවීම සම්බන්ධ අවබෝධතා ගිවිසුම වැඩි දියුණු කිරීමට හා ඉදිරි පියවරන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. වැඩි දියුණු කල ගිවිසුම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එකඟතාවය සඳහා ඉදිරිපත් කර ඇත. ඒ සම්බනධයෙන් දැනට ගුවන් හමුදාව ඉදිරි කටයුතු කරමින් පවතී. මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමත් මෙම අධිකාරිය නිරන්තරයෙන් සිදු කරමින් පවතී. | වාහන 03 පවරා ගැනීමට හා වත්කම් ඌන උපයෝජිත තත්ත්වයේ නොතැබීමට කටයුතු කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ අයිතම අංක 2.3.3 යටතේ අධිකාරියේ සියලුම රසායනාගාර සඳහා Procurement of consumables glassware chemicals and safety requirements මිලදී ගැනීම සඳහා රු.මිලියන 2 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | යම් ප්‍රමාදයක් සිදු වී ඇත. ඇණවුම් කරන ලද උපකරණ කොටස් වශයෙන් රසායනාගාර වෙත ලැබෙමින් පවතී. | සැලැසුම් කල පරිදි කාර්යයන් සම්පූර්ණ වන්නේද යන්න පසුවිපරම් කටයුතු සිදු කල යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,083,333 ක් වැය කර තණකොල කපන යන්ත්‍ර 60 ක් රු.1,083,333 ක් (Bush cutter) 2021 දෙසැම්බර් 27 දින මිලදීගෙන තිබුණු අතර 2022 අප්‍රේල් 7 දින සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී ඉන් යන්ත්‍ර 55 ක් භාවිතා නොකර මාස 04 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදි විධිමත් අයුරින් සුරකිමු ගංගා ප්‍රාදේශිය කමිටු මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් වලට අනුව බෙදා දිමට කටයුතු කරනු ලැබේ. | විධිමත් ක්‍රමවේදයක් මත ව්‍යාපෘති අරමුණු ඉටුවන පරිදි උපකරණ බෙදාදීම් සිදු කර වාර්තා විගනනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | 2021 වර්ෂය තුළදී රු.7,420,000 ක් වැය කර මිලට ගෙන තිබූ පරිසර නියමු කැප්වලින් සියයට 84.53 ක් එනම් රු.6,272,000 ක් වටිනා කැප් 2022 මාර්තු 18 දින වන විටත් අදාල කාර්යය වෙනුවෙන් යොදුවා නොතිබුණි. | රට යතා තත්වයට පැමිණිවිට ඉහත තොග බෙදා හැරීමට කටයුතු කරන ලදි. | අවශ්‍යතාවය නිවැරදිව තහවුරු කිරීමෙන් පසු ඇණවුම් කිරීමත් සැලැසුම් කල පරිදි බෙදා දීමටත් කටයුතු කල යුතු අතර ඒ සම්බන්ධ වගකීම නිලධාරියකුට පැවරිය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 හා 2020 වර්ෂවලට අදාලව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | රටේ පවතින මුද්‍රණ ද්‍රව්‍යයන්ගේ හිඟකම හේතුවෙන් මෙම වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට ප්‍රමාදවි ඇත. | වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කල යුතුය. |